

සේවා ස්ථානයේ ඔබගේ හෝ සහෝදර සේවකයන්ගේ සෞඛ්‍යයට අහිතකර සේවා වතාවරණයක් පවතී යයි සිතන්නේ නම් කරුණාකර අප අමතන්න.

විමසීම් :

කම්කරු කොමසාරිස්
වෘත්තීය ස්වස්ථතා අංශය
**කම්කරු දෙපාර්තමේන්තුව**
නො. 97, ජාවත්ත පාර,
කොළඹ 05.
දුරකතන අංකයඃ 011-2588759, 2581657
ෆැක්ස් අංකය ඃ 011 -2582731
ඊ-මේල් : sldohl@lanka.ccom.lk

# කම්කරු සබඳතා හා විදේශ රැකියා අමාත්‍යංශය..

*වෘත්තීය සෞඛ්‍ය සහ ස්වස්ථතාවය සුරකිමු.*



*ආපදා රහිත සේවා පරිසරයක් තුළින් ඵලදායිතාවය ඉහල නංවමු.*

**කම්කරු කොමසාරිස් ජනරාල්**
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

ඔබගේ සේවා ස්ථානයේ සුරක්ෂිතතාවය පිළිබඳව ඔබ සෑහීමකට පත්වේද?

◈ අධික උෂ්ණත්වය
◈ දුර්වල ආලෝකය
◈ අධික ශබ්දය
◈ දූෂිත වාතාශ්‍රය
◈ රසායනික ද්‍රව්‍ය භාවිතය
◈ දැඩි විඩාව දැනෙන බර වැඩ

ඔබගේ ශරීර සෞඛ්‍යයට අහිතකර විය හැකිය. මෙම ආපදා ප්‍රමාණාත්මකව නිර්මාණය කිරීමට මගින්, එම ආපදා පාලනය කිරීමටත්, ඔබ ඒවායින් ආරක්ෂා කිරීමටත් අපට උපකාරී විය හැකිය.



ඔබගේ වැඩපලේ මෙවැනි අවදානම් තත්ත්වයන් ඇත්නම් අපට දන්වන්න.

අපගේ සේවාවන්,

◈ සේවා ස්ථානයේ ඇති පීඩාකාරී පාරිසරික සාධක විද්‍යාත්මකව නිර්මාණය කිරීම

◈ වෘත්තීය රෝග හඳුනා ගැනීම සඳහා සේවකයන්ගේ සෞඛ්‍ය පරීක්ෂා කිරීම සහ ඒ සඳහා කරනු ලබන විශේෂ පරීක්ෂණ (පෙනහලු ක්‍රියාකාරිත්වය, ශ්‍රවණ දුර්වලතා පිළිබඳ පරීක්ෂණ, ශරීරගත විෂ සහිත රසායන ද්‍රව්‍ය පරීක්ෂා කිරීම)

◈ සේවා ස්ථානයේ වැඩකරන පරිසරයේ තත්ත්වය දියුණු කිරීම සඳහා තාක්ෂණික උපදෙස් සැපයීම.

◈ රසායනික ආපදා පාලනය සඳහා තාක්ෂණික තොරතුරු සැපයීම.

◈ වෘත්තීය ස්වස්ථතාවය සහ සෞඛ්‍ය පිළිබඳ සේවක සේව්‍ය දෙපක්ෂයම දැනුවත් කිරීම.

සේවා ස්ථානයක ඇති පීඩාකාරී වාතාවරණය සමනය කිරීම තුලින් සේවකයන්ගේ සුරක්ෂිතතාවය තහවුරු වන අතර සේවා ස්ථානයේ ඵලදායිතාවය වැඩි දියුණු වේ.



පුහුණු සේවකයෙකු වන ඔබ ඔබගේ අයතනයට සම්පතකි.

සෞඛ්‍ය සම්පන්න නිරෝගිමත් සේවකයෙකු
වන ඔබ පෞද්ගලිකව
ඔබගේත්,
ඔබ පවුලේත්,
ඔබ සේවය කරන ආයතනයේත්,
පොදුවේ මුලු රටෙහිමත්
දියුණුවට මහඟු පිටිවහලක් වේ.